# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13

### 2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

### ( පැරණි /නව නිර්දේශය)

### ජාත්‍යන්තර අධ්‍යයනය - න්‍යාය සහ ප්‍රවේශය INTS E - 1015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 03 යි

ප්‍රශ්න සංඛ්‍යාව 08 යි .

1 ජාත්‍යන්තර සබඳතා යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. එය අධ්‍යයන විෂයක් ලෙස වර්ධනය වූ ආකාරය පෙන්වා දෙන්න.

2 ජාත්‍යන්තර සබඳතා තුල ජාත්‍යයන්තර දේශපාලනයට හිමිවන ස්ථානය පිළිබඳ විමසීමක යෙදෙන්න.

3 මාක්ස්වාදී ප්‍රවේශය යනු කුමක්ද යන්න පැහැදිලිකර නූතන ජාත්‍යන්තර දේශපාලනය අධ්‍යයනයේදී එම ප්‍රවේශයේ ඇති ශක්‍යතාවය පිළිබඳ විමසීමක යෙදෙන්න.

4 "නූතන ජාතික රාජ්‍යය ගොඩනැගීම සඳහා බලපාන ලද ප්‍රධාන සාධකයක් ලෙස 13 වන සියවසේ සිට වර්ධනය වෙමින් ආ ජාතිකවාදය හැඳින්විය හැකිය." විමසන්න.

5 "ජාත්‍යන්තර සබඳතා තුල රටක ජාතික බලය (National Power) එහි ජාතික අභිලාෂ සාධනය කරලීම තීරණය කරන ප්‍රධාන සාධකය බවට පත්ව තිබේ." විමසන්න.

6 "පළමු ලෝක යුධ සමය වනතෙක්ම ජාතීන්ගේ සාමූහික ආරක්ෂාව සහතික කිරීම සඳහා අනුගමනය කළ රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාදාමය වූයේ බලතුලනය පවත්වාගෙන යෑමයි. " යුරෝපා දේශපාලන සන්දර්භය ඇසුරින් විමසන්න.

7 මැදිහත්වීමේ සංකල්පය (Intervention) කුමක්ද යන්න පැහැදිලිකර වර්තමානයේදී ජාත්‍යන්තර පද්ධතිය තුළ සිදුවන මැදිහත්වීමේ ආකාර මොනවාද යන්න පෙන්වා දෙන්න.

8 පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1 වෙස්ට්ෆේලියා ගිවිසුම (Treaty of westphalia)

2 මෘදු බලය (Soft Power)

3 මොර්ටන් කැප්ලාන් ඉදිරිපත් කළ බල තුලන ආකෘතීන්

4 නිරායුධකරණය (Disarmament)

**********************************************************************